ත්‍රිකුණාමලය නගර සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------------

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 ඔක්තෝබර් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 දින ද ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 ජනවාරි 06 දි සභාවේ ලේකම්වරයා වෙත යවන ලදි.

1.3 මතය ව්‍යාවනය කිරිම
---------------------------

මෙම වාර්තාවේ 1.3.1 සිට 1.3.5 ඡේද දක්වා ඇති කරුණු වල වැදගත්කම හේතුකොට ගෙන විගණන මතයක් ප්‍රකාශ කිරිම සඳහා ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි මට ලබාගත නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති
--------------------------------

ගිණුම් පිළියෙල කිරීමේදි යොදාගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ දෝෂ
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ දෝෂ නිරික්ෂණය විය.

(අ) වසර 2010 සිට 2013 දක්වා කාලය තුල දී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලද වාහන හයක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) නගර සභා ආයුර්වේද මධ්‍යස්ථානයේ 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ ඖෂධ තොග වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) නගර සභා සේවකයන් ගෙන් විශ්‍රාම වැටුප් දායක වශයෙන් අයකරගත් රු.6,136,695 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දින වන තුරුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබූ අතර එය සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ගව ඝාතකාගාර කුලී රු.143,349 ක් වූ මුදල ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නගර සභාවට සපයන ලද ජලය සඳහා ගෙවිය යුතු රු.4,645,367 ක මුදලක් 1991 වර්ෂයේ පටන්ම බේරුම් කර නොතිබූ නමුත් එය සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඊ) කාර්ය මණ්ඩල ණය ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ හිටි ණය ශේෂය රු.16,854,261 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.17,581,796 ක් වශයෙන් දක්වා තිබුණි. එම නිසා කාර්ය මණ්ඩල ණය ශේෂය රු.727,535 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශණ වල දක්වා තිබුණි.

(උ) තැන්පතු වලට අදාලව නාගරික සංවර්ධන අධිකාරියෙන් සමාලෝචිත වර්ෂය තුලදී පොලී ආදායම වශයෙන් ලද රු.123,913 ක් වූ මුදල මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඌ) සභාව විසින්, සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත හෝටල් සහ භෝජනාගාර වෙතින් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගත් රු.430,820 ක් වූ බදු මූල්‍ය ප්‍රකාශන වල වෙනම පෙන්නුම් කර නොතිබුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම
----------------------

අවිනිශ්චිත ගිණුමේ දැක්වුණු රු.30,153,029 ක් වූ බැර ශේෂය නිරවුල් කිරිමට කටයුතු නොකර 2010 වර්ෂයේ පටන් දිගින් දිගට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) එකතුව රු.6,161,644 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 2003 වර්ෂයේ සිට හිඟහිට තිබුණි. එනමුත් එම ශේෂ අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.4,557,338 ක් වූ හඳුනා නොගත් බැර ශේෂ හඳුනාගෙන ඒවා නිරවුල් කිරිමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ පටන් දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශණ වල දක්වා තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
----------------------------------------------

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | මුදල<br>රු. | විගණනය සඳහා ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 78,286,101 | ස්ථාවර වත්කම් ලේඛණය |
| උපයෝගී සේවා සඳහා ණය | 5,010,261 | ශේෂ තහවුරු කිරීමේ ලිපි, කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛණ |
| කාර්ය මණ්ඩල ණය | 15,293,760 | |
| අයවිය යුතු උපයෝගී සේවා | 110,137 | |
| ආදායම් ණයගැතියෝ | 96,005,110 | |
| පෙර ගෙවුම් | 2,240,952 | |
| ඉදිරියට ලැබීම් | 4,533,938 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 77,031,321 | |
| ණයහිමියන් | 1,191,632 | |

1.3.6 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම්

-----------------------------------------------------------

නැගෙනහිර පළාත් සභා මුදල් රෙගුලාසි අංක 433 ට අනුකූලව සභාවට අයත් වාහන 36 කට අදාල මාසික සාරාංශ විධිමත්ව පවත්වා නොතිබුණි.

2. ආදායම් පරිපාලනය

------------------------

2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම්

-----------------------------------------------------------------------------

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟහිටි ආදායම් වලට අදාල තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් සහ බදු | 62,100 | 31,249 | 80,270 |
| (ii) | බදුකුලී | 26,995 | 20,545 | 15,319 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 8,310 | 3,918 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 165,739 | 116,375 | 416 |

2.2 හිඟ කුලි

--------------

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණය සිදුකෙරේ.

(අ) සභාවට අයත් නිල නිවාස වල පදිංචිවී සිටි නිලධාරින් තිස්තුන් දෙනෙක් විසින් වසර ගණනාවක් සඳහා ගෙවල් කුලී නොගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.253,554 ක් හිඟහිට තිබුණි. එනමුත් මෙම හිඟ ගෙවල් කුලී අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් එලවළු වෙළඳ පොල සහ මාළු වෙළඳපොල කඩ කාමර 298 ක් කුලියට දී තිබුණි. එනමුත් රු.14,899,765 ක මුදලක් අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන වසර 06 කට අධික කාලයක් තිස්සේ හිඟහිට පැවතිණ.

3. මූල්‍ය සමාලෝචනය

-----------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,451,959 ක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,837,240 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------------

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------------

පහත සඳහන් නිරික්ෂණ සිදුකෙරේ.

(අ) සේවක අර්ථ සාධක අරමුදලට (සේ.අ.අ.) ගෙවිය යුතු දායක මුදල් ගණනය කිරීමේදි අනියම් සේවකයන්ගේ දළ වැටුප සැළකිල්ලට ගතයුතු වේ. එනමුත් සභාව විසින් අනියම් සේවකයන් 120 දෙනෙකුට අදාල සේ.අ.අ. ගණනය කිරීමේදී මූලික වැටුප පමණක් සැළකිල්ලට ගෙන තිබුණි. මේ හේතුකොටගෙන අයකළ යුතුව තිබූ දායක මුදල් එකතුව සහ සමාලෝචිත වර්ෂය සඳහා අයකර ප්‍රේෂණය කරණ ලද දාකය මුදල් එකතුව අතර වෙනස රු.2,635,185 ක් විය.

(ආ) සභාව විසින් සාප්පු 161 කින් සමන්විත වෙළඳ පොල ගොඩනැගිල්ල 2011 වර්ෂයේදි පවරාගෙන තිබුණි. එම සාප්පු අතුරෙන් සාප්පු 81 ක් 2011 වර්ෂයේ සිට කුලියට දීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් දල වශයෙන් රු.2,000,000 ක පමණ වාර්ෂික ආදායමක් සභාවට අහිමි වි තිබුණි.

(ඇ) නගර සභා ආඥා පනතේ 164 වගන්තියට අනුව සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින හෝටල් වලින් මුළු ආදායම පදනම් කර අයබදු අයකළ යුතු වුවත් එම හෝටල්වල ශුද්ධ ආදායම පදනම් කරගෙන අයබදු අයකර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.71,461 ක් වූ ආදායම් සභාවට අහිමි වී තිබුණි.

4.2 අක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
--------------------------------------------

සභාවට අයත් වාහන විසි අටක් අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු නොකර වර්ෂ 01 සිට 06 දක්වා වු කාල පරිච්ඡේදයක් තුල කාර්යාල පරිශ්‍රයේ අක්‍රියව පැවතිණි.

4.3 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------

4.3.1 මළ අපද්‍රව්‍ය හැසිරවීමේ යන්ත්‍රාගාරය තැනීම
-----------------------------------------------------

මෙම යන්ත්‍රාගාරය තැනීම සඳහා වු රු.6,401,355 ක් වටිනා කොන්ත්‍රාත්තුව 2012 ජනවාරි 28 දින සභාව විසින් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණ සිදු කෙරේ.

(අ) යන්ත්‍රාගාරය තැනීම සඳහා වු සම්පූර්ණ කොන්ත්‍රාත්තුව අදාල බලධාරින්ගෙන් අනුමැතිය මගහැරීම සඳහා කොටස් තුනකට බෙදා කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට පිරිනමා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියේ 5.4.8 වගන්තිය අනුව ප්‍රසම්පාදනලාභී ආයතනය විසින් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්රාත්තුව කඩකරනු ලැබුවහොත් ආයතනයට සිදුවිය හැකි පාඩුව වලක්වනු සඳහා කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට පහකට නොඅඩු ප්‍රමාණයක බැඳුම්කරයක් ලබාගත යුතුය. එනමුදු සභාව විසින් කාර්යසාධන බැඳුම්කරයක් ලබානොගෙන මෙම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් 2015 ඔක්තෝබර් මස තුලදී කොන්ත්‍රාත්තුව වැඩ අත්හැර දමා තිබු නමුත් එම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කටයුතු කිරීමට නොහැකි වි තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන් විසින් රු.4,485,156 ක් සඳහා වූ බිල්පත් වෙනුවෙන් මුදල් ලබාගැනීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. එනමුත් සභාව විසින් කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛණගත කිරීමෙන් තොරව අදාල වැඩ නිමකිරීම සඳහා කොන්ත්‍රාත්තු වැඩ නැවත ප්‍රදානය කර තිබුණි.

(ඈ) එක් කොන්ත්‍රාත්කරුවෙකු විසින් අතරමගදී දෙවන අදියරේ වැඩ අත්හැර දමා තිබූ නමුත් සභාව විසින් රු.304,491 ක් වූ රඳවුම් මුදල කොන්ත්‍රාත්කරුට නිදහස් කර තිබුණි.

(ඉ) ඉහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් අතරමග වැඩ අත්හැර තිබූ නමුත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් ඉංජිනේරු විසින් ඔහුගේ 2014 නොවැම්බර් 20 දිනැති ලිපිය පරිදි සියළු කොන්ත්‍රාත්වැඩ සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති බවට සහතික කර තිබුණි.

4.3.2 විදුලි වැටක් ඉදිකිරිම

----------------------------

පළාත් පාලන කොමසාරිස් විසින් රු.893,060 ක කොන්ත්‍රාත් වටිනාකමට 2014 ජුනි 20 දිනැතිව ප්‍රදානය කළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ බිම වන අලීන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා එය වටා විදුලි වැටක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සභාව විසින් අධීක්ෂණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණ සිදුකෙරේ.

(අ) පහත සඳහන් වැඩ විෂයයන් කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර නොතිබූ නමුදු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් ඉංජිනේරු විසින් වැඩ සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති බව සහතික කරමින් රු.197,700 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම නිර්දේශ කර තිබුණි.

| වැඩ විෂයය | ඒකක සංඛ්‍යාව | ගෙවූ මුදල |
|---|---|---|
| | | රු. |
| ඇම්පියර් 90-සූර්ය අයිතම | 02 | 110,000 |
| අකුණු සැර වෙනතට යොමු කිරීම් උපකරණ | 02 | 22,000 |
| අල්ලුව සහිත බිම් විදුලි උල් | 03 | 5,700 |
| පරික්ෂණ මනු | 03 | 60,000 |
| එකතුව | | 197,700 |

(ආ) පිරිවිතරයන්ට අනුව කොන්ත්‍රාත්කරු විසින් කි.වො. 7.5 ධාරිතාවයෙන් යුත් සූර්ය බලශක්ති සවිකළ යුතු විය. කොන්ත්‍රාත්කරු විසින් සපයා තිබුණේ කි.වො.1 ධාරිතාවයෙන් යුත් සූර්ය ශක්ති කෝෂ වූ නමුත් පිරිවිතරයන්ට අනුව රු.160,000 ක් ගෙවා තිබුණි. සූර්ය බලශක්ති කෝෂ නිසි පරිදි සවිනොකොට තාවකාලිකව තනන ලද මඩුවක වහලය මත කොන්ත්‍රාත්කරු විසින් තබා තිබූ බැව් නිරික්ෂණය විය.

(ඇ) පිරිවිතර හා සැලසුම් වලට අනුව වැට තැනීම සඳහා වූ ලී කණු දෙකක් අතර පරතරය මීටර් 4 ක් බැගින් තිබිය යුතු වුවද කොන්ත්‍රාත්කරු විසින් ලී කණු සිටුවා තිබුණේ මීටර් 33 ක දුරකින් නිසා එහි වැටට සවිකර තිබූ තෙකලා වයර එකිනෙක ගැටෙමින් පැවතිණ.

(ඇ) විදුලි වැටට ඒවා සිටවූ දින පටන් විදුලිය සම්බන්ධතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු විසින් සිටුවා තිබූ ලී කණු බොහෝමයක් වන අලීන් විසින් හානියට පත්කර තිබුණි.

(ඉ) විදුලි වැට තැනීම සඳහා යොදාගත් ලී කණු, වයර් ආදී සියළුම අයිතමයන් සොරුන් විසින් රැගෙන ගොස් තිබූ බැව් 2015 ඔක්තෝබර් 15 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එම නිසා මේ කාර්යය සඳහා දරන ලද එකතුව රු.618,858 වු වියදම නිශ්පල විමක් විය.

4.3.3 අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

ත්‍රිකුණාමලය නගර සභාව, ප්‍රාදේශීය සභා, නාගරික ප්‍රදේශ සහ සොහොන් බිම් වල වාර්ෂිකව එකතු කෙරෙන ආසන්න වශයෙන් වසරකට ටොන් 19,350 ක් පමණ බරැති අපද්‍රව්‍ය කන්නියා ප්‍රදේශයේ අපද්‍රව්‍ය කළමනාකරණ භූමියට දමා තිබුණි. මේ නිසා වන බිමෙහි දමා ඇති අපද්‍රව්‍ය හේතුකොට ගෙන පරිසර දූෂණය මෙන්ම වන අලින්ගේ සනීපාරක්ෂාවට හානිකර තත්ත්වයක් සිදුව තිබුණි.

4.4 සමීක්ෂණ මණ්ඩල වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(i) 2015 අගෝස්තු 24 දින පැවති සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ අයිතම 199 ක් වෙන්දේසියේ විකිණීමටත් අයිතම 80 ක් බැහැර කිරීමටත් නිර්දේශ කර තිබු නමුත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ පවත්වන ලද සමීක්ෂණ මණ්ඩලයට අනුව ගබඩා අයිතම 272 ක හා පුස්තකාල පොත් 218 ක ඌනතාවයක් අනාවරණය වී තිබුණි. එනමුත් කළමනාකාරීත්වය විසින් මෙම ඌනතාවය පිළිබඳව වගකිවයුතු නිලධාරින්ට එරෙහිව ගතයුතු පියවර මේ දක්වාම ගෙන නොතිබුණි.

4.5 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල සෑම මසක් අවසානයේදි රු.මිලියන 41 සිට රු.මිලියන 55 දක්වා පරාසයක වු ශේෂයන් බැංකු ජංගම ගිණුමක පැවති නමුත් ඒවා පොලී ඉපැයෙන ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

4.6 මානව සම්පත් කළමනාකරණය

------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාවට අදාල තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| විධායක ශ්‍රේණිය | 03 | 01 | 02 | - |
| ද්විතීය ශ්‍රේණිය | 94 | 69 | 25 | - |
| සුළු සේවක | 186 | 154 | 32 | - |
| වෙනත් (අනියම්/ තාවකාලික) | - | 110 | - | 110 |
| එකතුව | 283 | 334 | 59 | 110 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ

(අ) සභාවේ ගණකාධිකාරි තනතුර අවුරු 09 වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතියත් එම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය පරිපාලක, වින්නඹු, මහජන සෞඛ්‍ය පරික්ෂක, පරිවර්තක, කාර්මික නිලධාරි, පුස්තකාල භාරකරු, ආදායම් පරික්ෂක, වෙළඳ පරිපාලක, මෝටර් කාර්මික සහ ගිනිහට තනතුරු සඳහා වු පුරප්පාඩු විගණන පරික්ෂණ දින වු 2015 ඔක්තෝබර් 10 දින වනතුරුත් සම්පූර්ණ කර නොතිබුණි.

5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1 අයවැයමය පාලනය

ඇස්තමේන්තුගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 16 සිට සියයට 78 දක්වා වු පරාසයක විචලනයක් නිරික්ෂනය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බැව් නිරික්ෂණය විය.

5.2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැයමය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) තොග පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) කොන්ත්‍රාත් පරිපාලනය